**ශීර්ෂය 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කල මතය

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.1 (ඇ) (ඇ) (ඉ), 1.6.2, 1.6.3 හා 1.6.4 (ආ) ඡේදයන්හි ඇතුළත් නිරීක්ෂණය සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මැදවච්චිය, ඇඹිලිපිටිය, කරුන්චිකාඩු හා මාදම්පේ යන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සහ ගිරිතලේ නිල නිවස යන ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු 2018 දෙසැම්බර් 31 දින වනවිට නිම වෙමින් පැවතුණු අතර, එදිනට රු.9,764,046 ක් වූ නොනිමි වැඩ ශේෂය 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නොනිමි වැඩ යටතේ පෙන්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අදාළ ඉදිකිරීම්වල එකතුව රු.83,236,331 ක් වුවද, එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ලෙස දක්වා නොතිබුණු අතර, පෙර වර්ෂයේ නොනිමි වැඩ වශයෙන් දක්වා ඇති ඉහත නොනිමි වැඩ ශේෂය එලෙසම සමාලෝචිත වර්ෂය අවසානයටද දක්වා තිබුණි. | චක්‍රලේඛයේ 08 ඡේදය ප්‍රකාරව ඉදිකිරීම් නිම කර ඇති ගොඩනැගිලිවල පිරිවැය මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කළ යුතුය. | ගණන්දීමේ නිලධාරී අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | බදුල්ල සහ ගිරිතලේ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල ගොඩනැගිලි සමාලෝචිත වර්ෂයේදී ඉදි වෙමින් පැවතුණු අතර, 2019 දෙසැම්බර් 31 දින වනවිට එම වත්කම්වල රු.36,770,240 ක් වූ නොනිමි වැඩ පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය මඟින් හෙළිදරව් කර නොතිබුණි. | චක්‍රලේඛයේ 08 ඡේදය ප්‍රකාරව වර්ෂ අවසානයට නොනිමි වැඩ ශේෂයන් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කළ යුතුය. | ගණන්දීමේ නිලධාරී අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) | රු.මිලියන 13 ක වියදමින් පොලොන්නරු දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂයේ නිමකර ඇතත් 2017, 2018 වර්ෂවල සහ සාමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින්ද හෙළිදරව් කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 8.5 ඡේදය ප්‍රකාරව ඉදිකිරීම් නිමකර ඇති ගොඩනැගිලිවල පිරිවැය මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. | පොළොන්නරුව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය සිදු කල අතර ඊට අදාල රු.මිලියන 13 ක ප්‍රතිපාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබා දෙල ලදී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 වර්ෂයේදී ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයෙන් ඉඩම් බැංකු ව්‍යාපෘතිය යටතේ ලබා දී තිබුණු රු.මිලියන 37.83 ක ලැප්ටොප් පරිගණක, ඔප්ටිකල් කේබල් හා පිඹුරු පරිලෝකනය යන වත්කම් 2017, 2018 වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් ද හෙළිදරව් කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 8.5 ඡේදය ප්‍රකාරව වෙනත් ආයතනවලින් ලබාදුන් ප්‍රතිපාදන මත මිලදී ගෙන ඇති වත්කම් නිසි ලෙස ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. | මෙම වත්කම් අප ආයතනයේ තොග වාර්තාවන්ට නිසි පරිදි ඇතුලත් කර ඇත. කෙසේ වෙතත් සිගාස් වැඩසටහන මඟින් මෙම වත්කම් පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඉ) | මධ්‍යම, උතුරුමැද, නැගෙනහිර හා වයඹ යන පළාත්වල දෙපාර්තමේන්තුවට අයිති හිස් ඉඩම් හෙක්ටයාර් 1.3139 ක්ද, අනුරාධපුරය සහ ගලේවෙල යන ස්ථානවල ගොඩනැගිලි ඉදිකළ ඉඩම් 02 ක්ද, බදුල්ල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි නිල නිවස සහ අනුරාධපුරය පෙරසවි කඳවුර ඇතුළු දකුණු පළාතේ තවත් ගොඩනැගිලි 02 ක්ද තක්සේරු කොට ගිණුම්ගත කර නොතිබුණි. | ආයතනය සතු වත්කම් තක්සේරු කොට ගිණුම්ගත කළ යුතු වීම. | ප්‍රාදේශීය වශයෙන් එක් එක් කාර්යාලවලින් ලබා දුන් ඉඩම් හා ගොඩනැගිලිවලට අදාල දත්ත තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කිරීමෙන් පසු තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු වාර්තා ලබා දී ඇත. මේ වන තෙක් අනෙක් ඉඩම් හා ගොඩනැගිලි ඉදිරියේදී තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් මුදල් කටයුතු භාර නිලධාරීන් වෙනුවෙන් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | මු. රෙ. 891 (1) ප්‍රකාරව ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | ඇප ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. |

**1.6.3 විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි, ස්ථාන සියයක පිහිටි රු.මි. 5,689 ක් ලෙස අගයකර ගිණුම්ගත කර ඇති හෙක්ටයාර් 49.477 ක ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා ඔප්පු, පිඹුරු සහ ඉඩම් ලබාදීමේ සහතික සහ දිවයිනේ විවිධ ප්‍රදේශවල ස්ථාන 76 ක පිහිටි රු.මි. 1,009 ක් ලෙස අගය කර ඇති වර්ග අඩි 666,737 ක දෙපාර්තමේන්තු ගොඩනැගිලිවල නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට එම ගොඩනැගිලි ඉදිකළ භූමිභාගවල ඔප්පු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට අදාළ ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. | **මෙම ලේඛන ඉදිරියේදී ලබා දීමට කටයුතු කරනු ලැබේ.** |

**1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxviii පරිච්ඡේදයේ 9.1 වගන්තිය සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ස්ථාවර නියෝගයන්හි ix වන පරිච්ඡේදයේ 9.1 වගන්තිය හා 2014 ජනවාරි 09 දිනැති අංක 02/2014 දරන අභ්‍යන්තර ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛය | මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලවල ලේඛනාගාරවලින් මිනින්දෝරුවරුන් විසින් ලබා ගන්නා ලද මැනුම් කටයුතු සඳහා උපයෝගී කර ගන්නා ක්ෂේත්‍ර පොත්, ලේඛන හා වාර්තා 5,240 ක් 2020 ජුනි 30 දින වන විටත් එම කාර්යාලවලට ආපසු භාරදී නොතිබුණු අතර, එදින වන විට ආපසු භාරදීම ප්‍රමාද කළ කාල පරිච්ඡේදය මාස 03 සිට මාස 170 දක්වා පරාසයක පැවතුණි. | ලේඛනාගාර වලින් ලබා ගන්නා ලේඛන පොත්පත් සහ වාර්තා කඩිනමින් ආපසු ලබා ගැනීම සඳහා වැඩපිළිවෙලක් සකස් කළ යුතු වීම. | මේ සඳහා එකඟතාවය පළ කරන අතර ඉදිරියේ දී විස්තරාත්මක පිළිතුරක් ලබා දීමට අපේක්ෂා කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 | දෙපාර්තමේන්තුවේ මුදල් භාර සරප් නිලධාරීන් 37 දෙනෙකු සඳහා මු.රෙ. 880 ප්‍රකාරව ඇප තබා නොතිබුණි | රෙගුලාසි ප්‍රකාරව ඇප ලබා ගත යුතු වීම. | දැනට මුදල් භාර කටයුතුවල නියුතුවන්නේ වෙනත් සේවාවල අදාල නිලධාරීන් බැවින් ඉදිරියේදී එම නිලධාරීන්ගේ ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. |
| (ඇ) | 2009 ජුනි 17 දිනැති අංක 09/2009 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | තිස්සමහාරාම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජූලි මාසය දක්වා පමණක් නිලධාරීන්/සේවකයින් පස් දෙනෙකුගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් දෛනිකව වාර්තා වී නොතිබුණි. | රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විදුලි බලය ඇණ හිටි අවස්ථාවලදී යන්ත්‍ර අක්‍රියවීම නිසා මෙම තත්ත්වය හට ගෙන ඇති අතර, එම දිනයන්වලදී පැමිණීමේ ලේඛනයක පැමිණීමේ හා පිටවීමේ වාර්තා පවත්වා ගෙන ගොස් ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම සමඟ ඉදිරිපත් කළ (ඒසීඒ-3) ආකෘතිය පරිදි අග්‍රිම ලැබීම්වල එකතුව සහ අග්‍රිම ගෙවීම්වල එකතුව ලෙස පිළිවෙලින් රු.3,947,245,069 ක් හා රු.3,931,291,398 ක් පෙන්වා තිබුණි. ඒ අනුව මෙම ශේෂ අතර වෙනස රු.15,953,671 ක් විය යුතු වුවද, භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.9,218,360 ක් වූයෙන් රු.6,735,311 ක වෙනසක් පැවතුණි. මෙම වෙනස වර්ෂ අවසාන මුදල් ශේෂය වන රු.3,068 සමඟ එකතුකර මාර්ගස්ථ මුදල් ලෙස දක්වා සදොස් ලෙස අක්මුදල් ගැලපුම් ගිණුම තුලනය කර තිබුණි. | වෙනසකම් හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතුය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් New Cigas Web interface වෙත මුදා හැරීම යාවත්කාලීන කරන ලද අතර, එහි අග්‍රිම ගිණුම හා සම්බන්ධ ශේෂයන් පෙන්නුම් කරනු ලබන්නේ එක් එක් මාසයන් සඳහා වෙන් වශයෙනි. එම නිසා අග්‍රිම සඳහා සමාලෝචිත වර්ෂයටම අදාළ සාරාංශයන් පෙන්නුම් නොකෙරේ. |

**2.2** **ආදායම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව මුළු ආදායම් ලැබීම් ලෙස රු.432,574,895 ක ආදායමක් දක්වා ඇතත්, පරිගණක මුද්‍රිත සටහන අනුව දක්වා තිබුණු ආදායම රු.432,271,585 කි. මේ අනුව රු.303,310 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනස පැහැදිලි කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් විය. | වෙනස්කම් හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතුය. | 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සත්‍ය ආදායම රු. 432,271,585 කි. නමුත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අතපසුවීමකින් එය රු.432,574,895 ක් ලෙස සටහන් කර ඇත. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් සිතියම් සහ අංකිත දත්ත යාවත්කාලීන කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම නිසා යාවත්කාලීන නොවූ සිතියම් සහ අංකිත දත්ත අලෙවි කිරීමෙන් ජනතාවට ඉඩම් පිළිබඳව නිවැරදි තොරතුරු ලබා ගැනීමට නොහැකි වී ඇති අතර, මේ නිසා සිතියම් සහ අංකිත දත්ත විකුණුම් ආදායම ඉහළ නංවා ගැනීමටද නොහැකි වී තිබුණි. | ජනතාවට යාවත්කාලීන භූමි තොරතුරු ලබා දිය යුතු වීම හා ආදායම් මාර්ග වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තුවේ සිතියම් අලෙවි ප්‍රවර්ධනය සඳහා මාධ්‍ය මඟින් වැඩසටහන් ඉදිරිපත් කිරීමට හෝ පුවත්පත් රූපවාහිනී දැන්වීම් පල කිරීමට වෙනම ප්‍රතිපාදන කිසිවක් වෙන්කර නොමැත. නමුත් අපගේ දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ සියලුම සිතියම් හා නව සැපයුම් සියල්ල පලකර ඇති අතර ඒවායේ මිල ගණන් ද දක්වා ඇත. |

**2.3** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 22 ට අදාළව එකතුව රු.මි.20.02ක ඉතිරිවීම් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 17 කට අදාළව එකතුව රු.මි.140.27 ක ඉතිරිවීම් පැවතුණි. | මු.රෙ. 50 ප්‍රකාරව නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | මහා භාණ්ඩාගාරය විසින් ප්‍රමාණවත් අක්මුදල් ලබා නොදීම මෙම ඉතිරිවීම්වලට හේතු වූ බව දන්වමි. |
| (ආ) | වැය විෂයයන් තුනක් සඳහා ලබාදුන් එකතුව රු.මි. 68.5 ක පරිපූරක ප්‍රතිපාදනවලින් රු.මි. 55.58 ක මුදලක් හෙවත් සියයට 81 | පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ඇස්තමේන්තු වෙන් | ගණන්දීමේ නිලධාරී අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | ක් ඉතිරි කර තිබුණු අතර, 288-02-02-1401 වැය විෂයයට ලබා දුන් රු.මි. 2 ක සම්පූර්ණ පරිපූරක ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | කිරීමේ කාර්ය සඳහා යෙදවිය යුතුය. | |
| (ඈ) | වැය විෂයයන් 09 කට අදාළව එකතුව රු.මි.65.10 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයන්ට මාරුකරගෙන තිබුණු අතර, මෙසේ මාරුකර ගත් ප්‍රතිපාදනවලින් එකතුව රු.මි. 33.74 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරිකර තිබුණි. මෙම මාරුකරගත් ප්‍රතිපාදනවල ඉතිරිවීමේ ප්‍රතිශතය සියයට 27 සිට සියයට 100 දක්වා පරාසයක පැවැති අතර, 288-02-02-1301 වැය විෂයයට මෙසේ මාරුකරගත් සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | වෙනත් වැය විෂයන් සඳහා ප්‍රතිපාදන මාරු කර ගත්තේ නම් මාරු කර ගත් අරමුණට ප්‍රතිපාදන යෙදවිය යුතුය. | - එම - |
| (ඈ) | 288-02-02-2104 (ගොඩනැගිලි සහ ඉදිකිරීම්) වැය විෂයය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු අතර, මු.රෙ.66 මාරු පත්‍රය මඟින් රු.මි. 50 ක් වෙනත් ප්‍රාග්ධන වැය විෂයයකින් මාරුකරගෙන තිබුණි. එම මාරුකරගත් ප්‍රතිපාදන වලින් රු.මි. 25.21 ක් හෙවත් සියයට 50 ක් ඉතිරි කර තිබුණි. | වෙනත් වැය විෂයන් සඳහා ප්‍රතිපාදන මාරු කර ගත්තේ නම් මාරු කර ගත් අරමුණට ප්‍රතිපාදන යෙදවිය යුතුය. | - එම - |

**2.4 බැරකම් හා බැඳීම් වලට එළඹීම**

-----------------------------------

දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ එළඹී වැය විෂයයන් 08 ක රු.1,102,323 ක බැරකම්, මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරවු කර නොතිබුණි.

2.5 තැන්පත් ශේෂයන්

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල 2019 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-4) තැන්පත් ගිණුම්වල එකතුව රු. 11,141,292 ක් වන අතර, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව එදිනට ශේෂය රු.11,049,223 ක් වූයෙන් රු. 47,069 ක වෙනසක් පැවතුණි. මෙම වෙනස පැහැදිලි කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | වෙනස්කම් හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතුය. | 2015 වර්ෂයේ අංක 6000-0000-00-0015-0143 දරන පොදු තැන්පත් ගිණුම ශුන්‍ය කර වසා දමන ලද නමුත්, ඇතැම් පළාත් කාර්යාල විසින් එම ගිණුම ශුන්‍ය කර නොමැති අතර, මේ හේතුවෙන් භාණ්ඩාගාර පොත් සහ දෙපාර්තමේන්තු පොත් අතර, මෙම වෙනස පවතී. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ලෙජර් ගිණුම් සම්බන්ධයෙන් තැන්පතු කාල විශ්ලේෂණය සිදු කිරීමේදී වර්ෂ 05 - 07 අතර, රු.81,204 ක්ද, වර්ෂ 2 - 4 අතර, රු.2,814,214 ක්ද වශයෙන් දීර්ඝ කාලීන නිරවුල් නොකළ තැන්පතු ශේෂ පවතින බව නිරීක්ෂණය විය. මේවා නිරවුල් කිරීමට හෝ මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව ක්‍රියාකර රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | මෙම ශේෂ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්මින් පවතින බව දන්වමි. |

**2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ නිලධාරීන්/සේවකයින්ගෙන් අය කිරීමට ප්‍රමාද කර ඇති එකතුව 5,908,230 ක ණය ශේෂ අතුරින් රු.3,075,874 ක් එනම්, සියයට 52 ක් වසර 05 ඉක්මවන ණය ශේෂ බව නිරීක්ෂණය වූ අතර, ඇතැම් ණය ශේෂ වර්ෂ 40 ඉක්මවා ගිය ණය ශේෂ බවද නිරීක්ෂණය විය. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. | අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පසුගිය වර්ෂයේ ඉදිරිපත් කල පහත සඳහන් නිර්දේශ මෙම වර්ෂයේදීද ක්‍රියාත්මක කර නොතිබුණි.

| 2018 වර්ෂයේ ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 3.1 | ඉඩම් තොරතුරු සැපයීමේ සඳා ප්‍රමුඛයා වීම දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර, ගුණාත්මක භූමි තොරතුරු සැපයීම ප්‍රධාන මෙහෙවර වේ. පසුගිය දශකයකට අධික කාලය තුළ ශ්‍රී ලංකා භූමියෙහි සිදු වූ වෙනස්වීම් යාවත්කාලීන කළ සිතියම් ප්‍රකාශයට පත් කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතු වුවද, ශ්‍රී ලංකා ජාතික සිතියම් සංග්‍රහය 2008 වර්ෂයෙන් පසුව යාවත්කාලීන කර ප්‍රකාශයට පත්කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ දැක්මට හා මෙහෙවරට අනුකූලව ප්‍රායෝගිකව කටයුතු කළ යුතු වීම. |
| 3.6 (අ) | දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ නිල නිවාස 08 ක් හා ඌව පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ තාක්ෂණික නිලධාරි නිල නිවස සමාලෝචිත වර්ෂය අවසානයටද අභාවිතව පැවතුණි. | දේපළ ආරක්ෂා කර ගැනීමටත්, උපයෝජනයටත්, පියවර ගත යුතු වීම. |
| 3.6 (ආ) | බිම් සවිය ප්‍රතිපාදන මගින් රු.මිලියන 312 ක් වැයකර මිලදී ගන්නා ලද මැනුම් උපකරණ ඇතුළු විවිධ ප්‍රාග්ධන වත්කම් හා රු.මිලියන 82 ක් වැය කර ඉදිකරන ලද ගොඩනැගිලි ඉඩම් අමාත්‍යාංශයෙන් පවරා ගැනීමකින් තොරව පරිහරණය කරමින් පවතී. | වෙනත් ආයතන සතු වත්කම් පරිහරණය කිරීමේදී ඒවා නඩත්තු කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ පිරිවැයද දෙපාර්තමේන්තුවට දැරීමට සිදුවන බැවින් එම ගණුදෙනුවල නීත්‍යානුකූලභාවය සඳහා එම වත්කම් විධිමත්ව පවරාගත යුතුවීම. |
| 3.7 | වර්ෂ 01 සිට වර්ෂ 30 කට අධික කාල පරාසයක් තුළ අවස්ථා 49 කදී වාහන, මැනුම් උපකරණ හා ගොඩනැගිලි යන වත්කම් වලට සිදුවී ඇති රු.මිලියන 6.8 ක අලාභහානි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ.103 පරිදි පාඩු හා හානි සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකර අලාභ අයකර ගත යුතු වීම. |
| 3.8 (ආ) | දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරයකුගේ මසකට මැනිය යුතු අවම බිම් කැබලි සංඛ්‍යාව (Norms) 20 ක් ලෙස වර්ෂ 36 කටත් පෙර පිහිටුවාගත් සම්මතය මැනුම් ශිල්පක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමඟ වර්තමානයට ගැලපෙන ආකාරයට සමාලෝචනය කර නොතිබුණි. | මැනුම් ශිල්ප ක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමඟ වර්තමානයට ගැලපෙන ආකාරයට මසකට මැනිය යුතු අවම බිම් කැබලි සංඛ්‍යාව අප්‍රමාදව සමාලෝචනය කළ යුතුය. |
| 3.8 (ඇ) | රු.මිලියන 9,622 කට තක්සේරුකර තිබුණු වාහන 327 ක් හා යන්ත්‍ර උපකරණ තොගය තක්සේරු කිරීමේදී වෘත්තීය තක්සේරුකරුවන්ගේ සේවය ලබාගෙන නොතිබුණි. | වත්කම් තක්සේරු කිරීමේදී රජයේ වෘත්තීය තක්සේරුකරුවන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| 3.8 (ඉ) | 2002 අංක 17 දරන මැනුම් පනතේ 08 වන ඡේදය අනුව සර්වේයර් ජනරාල්වරයා විසින් මුළු ශ්‍රී ලංකාවම ක්‍රම ක්‍රමයෙන් ආවරණය වන පරිදි සංඛ්‍යාංක හෝ වෙනත් ආකාරයෙන් භූ ගෝලීය දත්ත පාදකයක් සහ කැඩැස්තර දත්ත පාදකයක් පවත්වා ගෙනයාමට භූ ගෝලීය තොරතුරු පද්ධතියට ඇතුළත් කර තිබූ වර්ග කිලෝමීටර් 20760 ක් සඳහා වන දත්ත 1982 - 2007 අතර කාලපරිච්ඡේදයට අයත් පැරණි දත්ත බැවින් එමගින් ජනතාවට යාවත්කාලීන දත්ත ලබා ගැනීමේ අවස්ථාව මඟහැරී තිබුණි. | යාවත්කාලීන දත්ත සහ තොරතුරු ජනතාවට ලබා දීමට කටයුතු කළ යුතු වීම. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2020 ජුනි 30 දින වන විටත්, කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. | ගණන්දීමේ නිලධාරී අදහස් දක්වා නොතිබුණි. |

**3.3 ප්‍රසම්පාදනයන්**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මෙහි මිළ දී ගැනීමට සැලසුම් කරන ලද රු.මි 41 ක් වටිනා භාණ්ඩ වර්ග 41 ක භාණ්ඩ අයිතම 435 ක් සාමාලෝචිත වර්ෂයේ දී ප්‍රසම්පාදනය කර නොතිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් නොවූ රු.මි 38 ක් වටිනා භාණ්ඩ වර්ග 21 ක භාණ්ඩ අයිතම 928 ක් ප්‍රසම්පාදනය කර තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම අනුව කටයුතු කළ යුතුය. | රාජකාරි අවශ්‍යතාවය මත විටින් විට ලද ඉල්ලීම් සලකා බලමින්ද, පවතින ප්‍රතිපාදන ප්‍රමාණවත් වේද යන්න සලකා බලමින්ද මිලදී ගැනීම් සිදුකර ඇත. වර්ෂයේ විටින් විට ප්‍රතිපාදන වෙන්කල බැවින් ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් භාණ්ඩ සංශෝධනය කර ප්‍රසම්පාදනය කිරීමට සිදුවිය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රු.මි 54 ක් වැය කර පූර්ණමාන උපකරණ 56 ක් මිළ දී ගැනීමේ දී මිළ දී ගන්නා ප්‍රමාණය නිසිලෙස සැලසුම් නොකිරීම නිසා පළමුව කැඳ වූ මිළ ගණන් අවලංගු කිරීමට සිදු වී තිබුණි. ජාතික ප්‍රසම්පාදන ක්‍රමය මත දෙවන වරට කැඳ වූ මිළ ගණන් මත මිළ දී ගැනීමේ දී එක් තරඟකරුවෙකුට පමණක් මිළ ගණන් ලබාදිය හැකිවන පරිදි පිරිවිතර ලේඛනය සකස් කර තිබීම නිසා සාර්ථක ලෙස මහජන තරඟයට ඉදිරිපත් වී නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මාලාවේ 5.6 වගන්තිය පරිදි නිශ්චිත නිෂ්පාදකයෙකුගේ නිෂ්පාදන අයිතමයන්ට සීමා කෙරෙන විස්තර ඇතුළත් පිරිවිතර ලේඛන සකස් නොකළ යුතු බව දක්වා ඇති අතර එම මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. | තාක්ෂණික වශයෙන් දියුණු උපකරණ මිලදී ගැනීමේ බලාපොරොත්තුව මත පළමුව කැඳවන ලද මිල ගනන් අවලංගු කරන ලදී. |
| (ඇ) | රු.මිලියන 5 ක් වැයකර ලැප්ටොප් පරිගණක 46 ක් ප්‍රසම්පාදනය කර ගැනීමේ දී ලංසුකරුවන්ට ලංසු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී නොතිබුණි. රු.මිලියන 12 ක් වැය කර ලැප්ටොප් පරිගණක 100 ක් මිළ දී ගැනීමේ දී හා රු.488,750 ක් වැය කර ආරක්ෂක සපත්තු යුගල 500 ක් මිළ දී ගැනීමේ දී ලංසු භාර ගැනීමේ අවසාන දිනෙන් පසු ලංසු විවෘත කිරීම දින 12 ක් ප්‍රමාද කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මාලාවේ 6.2.2. වගන්තිය ප්‍රකාරව ලංසු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දිය යුතු වීම හා 6.3.3 (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි ලංසු වැසීමත් සමඟ හැකිතාක් ඉක්මණින් ලංසු විවෘත කළ යුතුය. | වෙන් කළ ප්‍රතිපාදන වලින් උපාංග මිලදී ගැනීම් සීමිත කාලය තුල කළ යුතුව තිබූ බැවින් දින 07 ක අවම කාලයක් ලංසු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීමට සිදු වූ බව දන්වමි. 2021 වර්ෂයේ සිට ප්‍රමාදයකින් තොරව ලංසු විවෘත කිරීමට පියවර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙමි. |
| (ඇ) | රු.මිලියන 5 ක් වැය කර ඡායා පිටපත් යන්ත්‍ර 42 ක් මිළ දී ගැනීමේ දී මිල ගනන් ඉල්ලීමේ ලේඛන (ලංසු ලේඛන) විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඔප්පු කිරීමේ පරීක්ෂණයක් (**Demostration**) පවත්වා ඇති බව දක්වා තිබුණද ඒ සම්බන්ධයෙන් වාර්තා පවත්වා නොතිබුණු අතර, ලංසු විවෘත කිරීමේදී විශේෂ හේතුවක් නොමැතිව ලංසු පිටපත් දෙකම (මුල් පිටපත සහ අනු පිටපත) විවෘත කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කරමින් රජයට වඩා වාසි සැලසෙන අයුරින් විනිවිද භාවයකින් යුතුව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. | ඔප්පු පරීක්ෂණය සිදු කර අදාළ පිරිවිතරයන් පරීක්ෂා කළ අතර ඒවා නිවැරදිව තිබුණි. වාර්තාව සකස් කිරීමේදී ඒ පිලිබඳව ඇතුළත් කිරීම අතපසුවීමකින් නොහැකි වී ඇත. ලංසුවල අනු පිටපත වැරදීමකින් විවෘත වී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මිල සැදහුම් ක්‍රමය අනුගමනය කරමින් මොනරාගල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය සඳහා එකතුව රු. මිලියන 3 ක සැපයුම් හා සේවා ලබා ගැනීමේදී සැපයුම්කරුවන් තෝරා ගැනීම, ලංසු ලේඛන සැකසීම, මිල ගණන් ඉල්ලුම් කිරීම සහ ලංසු විවෘත කිරීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව සිදු කර තිබුණි. ඒ හේතුවෙන් 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛයේ 1.2 මාර්ගෝපදේශයෙන් රජය අපේක්ෂා කළ අරමුණු ඉටුකර ගැනීමට බාධාවක් වී තිබුණි. | සැපයුම් හා සේවා ලබා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කළ යුතුය. | මොනරාගල ප්‍රදේශයේ ප්‍රමාණවත් සැපයුම්කරුවන් නොමැති වීම මෙම තත්වයට හේතු වී ඇත. |
| (ඊ) | නුවරඑළිය මිනින්දෝරු අධිකාරී නිල නිවස ගිලා බැසීමේ අවධානමකට ලක්වන බවට වූ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශයන් නොසලකා හරිමින් රු. 447,555 ක වියදමින් ගොඩනැගිල්ලේ සිවිලිම හා බිම් ගඩොල් ඇතිරීම ඇතුළු අලුත්වැඩියාවන් සිදු කර තිබුණි. එම අලුත්වැඩියාවෙන් පසුව ගොඩනැගිල්ලේ සියලුම බිත්ති සහ ගෙබිමේ ඇතැම් ප්‍රදේශ විශාල ඉරි තැලීම්වලට ලක්ව තිබුණු අතර, පදිංචියට අනාරක්ෂිතව පැවතුණි. | ගිලා බැසීමේ අවදානමකට ලක්ව ඇති තත්ත්වයන් මත නවීකරන කටයුතු සිදු කිරීමට පෙර ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ උපදෙස් හා මගපෙන්වීම් ලබා ගත යුතුය. | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී නිල නිවස ඉදිකිරීම සඳහා වෙනත් ස්ථානයක් නොතිබුණු බැවින්ද, කඩිනමින් මෙම අලුත්වැඩියාව සිදු කළ යුතු බැවින්ද, අදාළ අලුත්වැඩියාවන් සිදු කළ අතර, කටුමාන සංචාරක බංගලාව පිහිටි භූමියේ නව නිල නිවසක් ඉදිකිරීම සඳහා කටයුතු සකස් කරමින් පවතී. |
| (උ) | පුත්තලම් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ කොටසක බිම් ගඩොල් ඇතිරීම සහ කාර්මික හා පරිපාලන නිලධාරී නිල නිවස අලුත්වැඩියාව සඳහා වැය වූ එකතුව රු. මි. 1.29 ක වියදම සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම්වල සාක්ෂිකරුවන් අත්සන් කර නොතිබූ අතර, කොන්ත්‍රාත් වටිනාකම්ද ඇතුළත් කර නොතිබුණි. තවද, කාර්යාල | ප්‍රසම්පාදන සැලසුම් නිවැරදිව සකස් කළ යුතුවීම සහ ගිවිසුම්වල නීත්‍යානුකූලභාවය මෙන්ම ඉදිකිරීම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව කළ යුතුය. | නව ඉදිකිරීම් පමණක් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කරනු ලබයි. කොන්ත්‍රාත් ගිවිසුම්වල මෙවැනි අඩුපාඩු ඉදිරියේදී සිදු නොවීමට කටයුතු යොදා ඇත. කාර්මික හා පරිපාලන නිලධාරී නිල නිවස අලුත්වැඩියාව සිදු කිරීමේදී හදිසි නොවැලක්විය හැකි අලුත්වැඩියාවන් යෙදුන බැවින් සැලසුම්කළ ඇස්තමේන්තුවට අමතරව කටයුතු කිරීමට සිදුවී ඇත. |

ගොඩනැගිල්ලේ බිම් ගඩොල් ඇතිරීමේ කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්ත්‍රාත්තුවේ නමද වැරදියට ඇතුළත් කර තිබුණි. මෙය මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ. තවද රු. 448,325 ක වියදමින් කාර්මික හා පරිපාලන නිලධාරී නිල නිවස අලුත්වැඩියාවේදී රු. 108,140 ක වියදමින් සිදු කළ යුතු ඉදිකිරීම් අයිතමයක් ඉටු කර නොතිබූ අතර, රු. 148,287 ක වියදමින් බලය නොලත් අමතර වැඩ කොටස් 12 ක් සිදු කර තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **<u>නිශ්ක්‍රීය වත්කම්</u>**<br>සමාලෝචිත වර්ෂයේදීද රු.මි. 70.11 වටිනා ඉඩම් සහ ගොඩනැගිලි අභාවිතව පැවතුණි. | 2003 ජනවාරි 03 දිනැති හා අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය | ගණන්දීමේ නිලධාරී අදහස් දක්වා නොතිබුණි. |

## 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1989 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 29 කට ආසන්න කාල පරිච්ඡේදය තුළ දෙපාර්තමේන්තුවේ මැනුම් උපකරණ, ගොඩනැගිලි වැනි වත්කම් වර්ග 21 කට සිදු වූ රු.2,544,758 ක අලාභ හානි සහ 1998 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වාහන 28 කට සිදු වූ රු.4,251,626 ක අනතුරු හානි අයකර ගැනීමට හෝ පොත්වලින් කපාහැරීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ.103 පරිදි පාඩු හා හානි සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. | සියලුම වාහන අලාභහානි අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ ලැබුණු මැනුම් නියෝග 14,709 ත් සමඟ 2009 වර්ෂයේ සිට 2019 වර්ෂය අවසානය දක්වා දෙපාර්තමේන්තුව නිම කළ යුතුව තිබුණු මුළු මැනුම් නියෝග සංඛ්‍යාව 48,152 ක් වුවත්, ඉන් මැනුම් නියෝග 27,113 ක් හෙවත් සියයට 56 ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | උසාවි මැනුම් නියෝග ඇතුළු හිඟහිට ඇති මැනුම් නියෝග ප්‍රමාණය සම්පූර්ණ කිරීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතුය. | මිනින්දෝරු දෙපාර්තමේන්තුවට වසරකට නොයෙකුත් ආයතනවලින් විශාල මැනුම් ඉල්ලීම් ප්‍රමාණයක් ලැබේ. එම ප්‍රමාණය සම්පූර්ණ කිරීමට රජයේ මිනින්දෝරුවරුන්ට අපහසුය. ප්‍රමුඛතාවය දිය යුතු මැනුම් ඉල්ලීම් තෝරා ගෙන ඒවා ඉටු කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග අංක 7.4.3 හා 7.15 යටතේ මිනින්දෝරුවරුන්ගේ රාජකාරී කටයුතු නියාමනය කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාලවල එක් එක් මිනින්දෝරුවරුන් වෙනුවෙන් පවත්වා ගත යුතු ජ'නල් මොනරාගල, තිස්සමහාරාම හා නුවරඑළිය යන ප්‍රාදේශීය මිනින්දෝරුවරු කාර්යාලවල යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය. මේ නිසා මෙම නිලධාරීන්ගේ රාජකාරි නිසි ලෙස අධීක්ෂණය නොකරන බව නිරීක්ෂණය වී ඇත. | මිනින්දෝරුවරුන් ගේ රාජකාරී පාලනය කිරීම සඳහා දෙපාර්තමේන්තු පිහිටුවා ගෙන ඇති නීති රීති හා සම්මතයන් අනුව කටයුතු කළ යුතුය. | දෙ. නි. 7.4.3 සහ 7.15 අනුව සිදු කළ යුතු කටයුතු නිසි අයුරින් සිදු කිරීමටත්, මිනින්දෝරුවරුන්ගේ ජ'නල් ක්‍රමවත්ව සටහන් කිරීමටත් සියලුම මිනින්දෝරු අධිකාරීන්ගේ මාර්ගයෙන් මිනින්දෝරුවරුන් දැනුවත් කරන ලදි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සිදු කරන ලද විගණන නියැදි පරීක්ෂාවකදී තිස්සමහාරාම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ මිනින්දෝරුවරුන්ට පූර්ණමාන ඇතුළු මැනුම් උපකරණ නිකුත් කිරීමේදී හා ආපසු භාර ගැනීමේදී නිසි පරිදි ලේඛන යාවත්කාලීන කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | රජයේ වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුය. | විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු මේ වන විට නිවැරදි කර ඇති අතර, ඉදිරියේදී එවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු යොදා ඇත. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ තිස්සමහාරාම ප්‍රාදේශීය කාර්යාලය පවත්වා ගෙනයාමට මසකට රු. 25,000 බැගින් පුද්ගලික නිවසක් කුලියට | ගිවිසුම්වල නීත්‍යානුකූලභාවය පිළිබඳවත් දෙපාර්තමේන්තුවේ | මෙම ගොඩනැගිල්ල පුද්ගලික වසාස්ථානයක් සඳහා ඉදිකළ ගොඩනැගිල්ලක් හෙයින් කාර්යාල ක්‍රම පවත්වා ගැනීමේදී ගැටළු මතුවීම |

| | | | |
|---|---|---|---|
| | ගෙන තිබුණු අතර, කුලී ගිවිසුමට දෙපාර්ශවය අත්සන් කිරීම මාස 03 කින් ප්‍රමාද කර තිබුණි. තවද, මෙම ගොඩනැගිල්ලේ ඉහළ මහලේ හිමිකරුවන් පදිංචිව සිටීම නිසා අනාරක්ෂිත තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය. | වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහාත් වඩා වැඩි අවධානයක් යොමු කළ යුතුය. | සත්‍ය වේ. ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව කුලී ගිවිසුම්වලට එළඹීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත. 2020 වර්ෂයේ නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. |
| (ඉ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතු අස්ථිත්වයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | විගණන පනතේ අදාළ වගන්තිය ප්‍රකාරව කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතුය. | ගණන්දීමේ නිලධාරී විසින් අදහස් දක්වා නොතිබුණි. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ නිලධාරින්, සේවකයන් 5639 ක් සඳහා ප්‍රවර්තන වර්ෂය තුළ පුහුණුවක් ලබා දී නොතිබුණි. | පුහුණුව මඟින් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. | නිලධාරීන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන දෙපාර්තමේන්තුවට ලැබී නොතිබුණි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩලවල හැකියා වර්ධනය (පුහුණු පාඨමාලා) සඳහා රු. මි. 9.26 ක මුදලක් වෙන් කර තිබුණු අතර ඉන් රු. මි. 3.41 ක් වැය කර නිලධාරීන් / සේවකයින් 431 දෙනෙකුට පමණක් පුහුණු වැඩමුළු පවත්වා තිබුණි. | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කර සේවකයින්ගේ හැකියා වර්ධනය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී පිළිතුරු ලබා දීමට අපේක්ෂා කරමි. |
| (ඇ) | ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටමේ පුරප්පාඩු 204 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනිමට කටයුතු කර නොමැති අතර, මෙම තත්ත්වයද දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය වර්ධනය කර ගැනීමට බාධාවක් වී තිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | කාර්මික හා පරිපාලන නිලධාරින් විසින් සිතියම් තාක්ෂණ නිලධාරින් අධීක්ෂණය කළ යුතු වුවද, මිනින්දෝරු සේවයේ නිලධාරින් විසින් සිතියම් තාක්ෂණ නිලධාරින් 61 දෙනෙකු අධීක්ෂණය කර තිබුණි. | කාර්මික හා පරිපාලන නිලධාරීන් විසින් සිතියම් තාක්ෂණ නිලධාරීන් අධීක්ෂණය කළ යුතු වීම. | ගණන්දීමේ නිලධාරී විසින් අදහස් දක්වා නොතිබුණි. |